# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, තැ.පෙ. 1559, කොළඹ 0 1.
பொதுத்திறைசேரி, நிதி திட்டமிடல் அமைச்சு, த.பெ.இல.1559, இகொழும்பு 01.
General Treasury, Ministry of Finance & Planning,P.O.Box:1559, Colombo 01.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 0094 112 484729, tod_dg@tod.treasury.gov.lk
ෆැක්ස් / பெக்ஸ் / Fax: 0094 112 320042, 0094 112 484828
පොදු / பொது / General: 0094 112 484500, 0094 112 484600


මගේ අංකය / எனது இல / My No.: TOD/D/CA/2010
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2010.07. 12

හාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක :- 3/2010

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත.

**<u>2010 වර්ෂයේ අනුමත ඇස්තමේන්තු යටතේ සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව අග්‍රිම සීමාවන් නියම කිරීම</u>**

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද 2009.11.23 දිනැති චක්‍රලේඛ අංක 3/2009 හි 2 ජේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02 චක්‍රලේඛයේ 2 ජේදයේ සඳහන් පරිදි අතුරු සම්මත ගිණුම යටතේ සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන පදනම් කර ගෙන ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශ අනුව අග්‍රිම සීමාවන් අනුමත කර ඇත. පාර්ලිමේන්තුව විසින් 2010 වර්ෂය වෙනුවෙන් අනුමත කර ඇති අයවැය ඇස්තමේන්තුවේ සලසා ඇති ප්‍රතිපාදන පදනම් කර ගෙන අග්‍රිම සීමා අනුමත කිරීම කල යුතු බැවින් ඒ සඳහා වන අයදුම් පත්‍ර (ආකෘති අංක 01) සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ආකෘති අංක 02) පිළියෙල කර ඒවා 2010.07.23 දින හෝ ඊට පෙර මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

අග්‍රිම සීමා තීරණය කිරීමේදී පහත සඳහන් ගැලපීම් සැලකිල්ලට ගත යුතු වේ. ( ඇමුණුම 01 බලන්න )

2.1 පුනරාවර්තන වියදම් (පුද්ගල පඩිනඩි) සඳහා වූ ප්‍රතිපාදන මත ගණන් බැලෙන අග්‍රිම සීමාව තීරණය කිරීමේ දී පහත සඳහන් ගැලපීම් සැලකිල්ලට ගත යුතුය. (ඇමුණුම 01 හි "ආ" බලන්න)

(i) වැ.අ.වි.වැ. වෙනුවෙන් වැටුප් හා වේතන සඳහා වූ ප්‍රතිපාදනයෙන් 6.5% ක්.

(ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ අවම බැර සීමාවට සමාන මුදලක්.

(iii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම යටතේ ගෙවන ණය සඳහා වන පොලී අය කිරීම්.

මීට අමතරව, සමස්ථ අග්‍රිම සීමාව ගණන් බැලීම සඳහා පහත දැක්වෙන තොරතුරු මෙම දෙපාර්තමේන්තුවට ලබා දිය යුතු වේ. එමෙන්ම ආකෘතිය 01 සම්පූර්ණ කිරීමේදී එහි සඳහන් (අ) සිට (ඵ) දක්වා වූ අයිතමයන් ගණනය කළ යුතු සහ සකස් විය යුතු ආකාරය අමුණුම 01 හි සඳහන් උපදෙස් පරිදි විය යුතු වේ.

(අ) එක් එක් මාසයේ දී ආදායම් වශයෙන් මුදලින් රැස් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන වටිනාකම. (2009 ජනවාරි මස සිට දෙසැම්බර් මස 31 දින දක්වා සත්‍ය වශයෙන් මුදලින් ලද ආදායම මාසිකව සඳහන් කළ යුතුවේ. - ඇමුණුම 01 හි "ඉ" බලන්න)

(ආ) ඔබ ආයතනය වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යම් ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබන්නේ නම්, එසේ වෙන් කර දෙනු ලබන මුළු ප්‍රතිපාදන ප්‍රමාණයන් සහ එම ප්‍රතිපාදන ලබා දෙන ආයතන පිළිබඳ විස්තර. (ආකෘති 3 අනුව)

(ඇ) ඉහත 2.1 හි සඳහන් අයිතමයන්ට අමතරව, හරස් සටහන් මගින් ගිණුම් ගත කිරීමට අපේක්ෂා කරනු ලබන වෙනත් වියදම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර.

(ඇ) 2009 හෝ ඊට පෙර වර්ෂ වලදී තුන්වන පාර්ශවයන්ගෙන් පොදු තැන්පත් ගිණුම යටතේ රැස් කර ඇති මුදල් ඇතොත්, ඒවා ආපසු ගෙවීම වෙනුවෙන් වූ මාසික මුදල් අවශ්‍යතාවයන් පිළිබඳ විස්තරයක්.

(ඇ) 2009 හෝ ඊට පෙර වර්ෂ වලදී තුන්වන පාර්ශවයන්ගෙන් පොදු තැන්පත් ගිණුම යටතේ රැස් කර ඇති මුදල් ඇතොත්, ඒවා ආපසු ගෙවීම වෙනුවෙන් වූ මාසික මුදල් අවශ්‍යතාවයන් පිළිබඳ විස්තරයක්.

(ඉ) යම්කිසි අමාත්‍යාංශයක්, භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා අග්‍රිම උපයෝගී කර ගෙන, එම අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අරමුදල් නිදහස් කරනු ලබන්නේ නම්, එවැනි අමාත්‍යාංශ, ඒ පිළිබඳ විස්තරයක් ද ඉදිරිපත් කළ යුතු වේ.

(ඊ) මෙයට අමුණා ඇති ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීම සඳහා ඔබ විසින් යොදා ගනු ලබන උපකල්පයන් සහ ගණනය කිරීම් වෙනමම විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතු වේ.

3. මෙම කරුණු සම්බන්ධව පැහැදිලි කිරීම් ලබා ගැනීම තවදුරටත් අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා පහත නම් සඳහන් නිලධාරීන් ඇමතිය හැක.

**අංශ භාර මාණ්ඩලික නිලධාරීන් :-**

| **නිලධාරියාගේ නම හා තනතුර** | **අංශය** | **දුරකථන අංකය** |
|---|---|---|
| ටී. නලීන් ඔෂෙන් මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | ජාතික ආරක්ෂාව, යුක්තිය පසඳලීම<br>සහ නීතිය බලාත්මක කිරීම | 2484739 |
| එස්. ඒ. එස්. වික්‍රමරත්න මහතා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | යටිතල පහසුකම් සංවර්ධනය.<br>සමාජ ආරක්ෂණය, ජීවනෝපාය හා<br>ප්‍රාදේශීය සංවර්ධනය | 2484743 |
| එන්.පී. ධර්මරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | රාජ්‍ය පරිපාලනය,මෙහෙයුම් සහ නියාමනය | 2484744 |
| එම්.ජී. බී. එල්. මනෝහරී මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂිකා | මානව සම්පත් සංවර්ධනය, කලාව ආගම සහ<br>සංස්කෘතික කටයුතු, විද්‍යා හා තාක්ෂණය,<br>පර්යේෂණ හා සංවර්ධනය | 2484740 |
| කේ. එස්. දයාරත්න මෙනෙවිය<br>සහකාර අධ්‍යක්ෂිකා | නිෂ්පාදන , සේවා සහ පරිසරය | 2484742 |

දයානන්ද විදානගමාච්චි
අධ්‍යක්ෂ ජනරාල්,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත :- 1. විගණකාධිපති,
2. රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

## 2010 වර්ෂයේ වාර්ෂික අක්මුදල් සීමාව ගණනය සඳහා වන උපදෙස්

(අ) අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා වෙන්කර දී ඇති ප්‍රතිපාදන පිළිබඳ විස්තර ආකෘති 03 අනුව සපයන්න.

(ආ) පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් වූ හරස් සටහන් පහත පරිදි සැකසිය යුතුය.

| | |
|---|---|
| වැ.අ.විශ්‍රාම වැටුප් දායක මුදල් අවකරණයන් | xxx |
| රා.නි. අත්තිකාරම් ගිණුමේ බැර සීමාව | xxx |
| වෙනත් (ණය පොලී ඇතුළුව) | xxx |
| | ----- |
| එකතුව | |
| | === |

(ඇ) එක් එක් වියදම් ශීර්ෂය යටතේ දක්වා ඇති රාජ්‍ය සංස්ථා සඳහා වූ ප්‍රදානයන් වැඩ සටහන් සේවා යටතට නොගත යුතුය.

(ඈ) විදේශාධාර (ණය) විදේශාධාර (ප්‍රදාන) සහ ප්‍රතිපාර්ශවීය අරමුදල් වැඩ සටහන් සේවා යටතට නොගත යුතුය.

(ඉ) මුදලින් රැස් කිරීමට බලාපොරොත්තු වන ආදායම්, ආකෘතිය 01 හි දක්වා ඇති පරිදි 08 වන තීරුවේ (2) වන කාණ්ඩය යටතේ සඳහන් කල යුතුය.

(ඊ) ප්‍රතිපූර්ණය කරන විදේශ ආධාර (ප්‍රදාන, ණය) සහ දේශීය අරමුදලෙන් භාණ්ඩාගාරයෙන් බලාපොරොත්තු වන මුළු අක්මුදල් පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් දැක්විය යුතුය.

| | |
|---|---|
| දේශීය අරමුදල | xxx |
| ප්‍රතිපූර්ණය කරන විදේශ ආධාර (ණය හා ප්‍රදාන) | xxx |

(උ) 08 වෙනි තීරුවෙහි "වෙනත් අත්තිකාරම් ගිණුම" යටතේ ඇතුලත් කෙරෙන මුදල පහත දක්වා ඇති පරිදි විය යුතුය.

| | |
|---|---|
| සම්පූර්ණ බැර සීමාව | xxx |
| අඩුකලා : හරස් සටහන් මගින් ගිණුම් ගත කෙරෙන ලැබීම් | xxx |
| ඇස්තමේන්තු ගත මුදල් ලැබීම් | xxx |

(ඌ) වර්ෂ 2009 දී භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගේ අනුමැතිය ලබා තැන්පත් ගිණුම් වලට මාරු කරන ලද යම් ප්‍රතිපාදනයක් ඇත්නම්, එම ප්‍රමාණ පමණක් ඇතුලත් කළ යුතුයි.

(එ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන වල මුළු වටිනාකම මෙහි ඇතුලත් කළ යුතු අතර, ඒ පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවේ.

# 2010 වර්ෂය සඳහා අක්මුදල් අයදුම් පත්‍රය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :

වැය ශීර්ෂය :

(රු.000)

| කාණ්ඩය | ඇස්තමේන්තු ප්‍රතිපාදන පිළිබඳ විස්තර | | | | | | මුළු ප්‍රතිපාදන | අවකරණ: හරස් සටහන් | අවකරණ: වෙනත් දෙපා: සඳහා වෙන් කිරීම (අ) | අවකරණ: දි./ලේ. කාර්යාල සඳහා වෙන් කිරීම (අ) | මුළු අවකරණ | වෙනත් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන ලැබීම | අක්මුදල් සීමාව | ආදායම් තැන්පත් හා වෙනත් ලැබීම් | භාණ්ඩාගාරයෙන් ලැබෙන අක්මුදල් | 2010.06.30 දක්වා භාණ්ඩාගාරයෙන් ලැබුනු අක්මුදල් | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අක්මුදල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | (1) | (2) | (3) | (4) | (5)=2+3+4 | (6) | (7) 1-5+6 | (8) | (9) 7-8 | (10) | (11)=9-10 |
| (1) | වැඩ සටහන් සේවා (පුනරාවර්තන)(ඇ),(ඈ) | | | | | | | | | | | | | | | | |
| | වැඩ සටහන | වැටුප් (1001-1003) | අනෙකුත් | | | | | | | | | | | | | | |
| | 1 | XX | XXX | | | | XX | XX | XX | XX | XX | .. | XX | .. | XX | XX | XX |
| | 2 | XX | XXX | | | | XX | XX | XX | XX | XX | .. | XX | .. | XX | XX | XX |
| | 3 | XX | XXX | | | | XX | XX | XX | XX | XX | .. | XX | .. | XX | XX | XX |
| | උප එකතුව | XXX | XXX(ඇ),(ඈ) | | | | XXX | XXX(ආ) | XXX | XXX | XXX | XXX | XXX | .. | XXX | XXX | XXX |
| (2) | වැඩ සටහන් සේවා (ප්‍රාග්ධන වියදම්) (ඇ) , (ඈ) * | | | | | | | | | | | | | | | | |
| | වැඩ සටහන | දේශීය අරමුදල් | වි.ආ. 13: දේ.ආ. | වි.ආ. 13: වි.ආ. | ප්‍ර.වි.ආ. 14/15: දේ.ආ. | ප්‍ර.වි.ආ. 14/15: වි.ආ. | | | | | | | | | | | |
| | 1 | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | .. | XX | XX | XX | XX | XX |
| | 2 | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | .. | XX | XX | XX | XX | XX |
| | 3 | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | .. | XX | XX | XX | XX | XX |
| | උප එකතුව | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX(ඉ) | XXX(ඊ) | XXX | XXX |
| (3) | තැන්පත් ගිණුම (උ) | | | | | | XXX | .. | .. | .. | .. | .. | XXX | .. | XXX | XXX | XXX |
| (4) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම (හර සීමාව) | | | | | | XXX | .. | .. | .. | .. | .. | XXX | .. | XXX | XXX | XXX |
| (5) | වෙනත් අත්තිකාරම් ගිණුම් | | | | | | | | | | | | | | | | |
| | 1. ............................................................ | | | | | | XX | XX | XX | XX | XX | .. | XX | XX | XX | XX | XX |
| | 2. ............................................................ | | | | | | XX | XX | XX | XX | XX | .. | XX | XX | XX | XX | XX |
| | 3. ............................................................ | | | | | | XX | XX | XX | XX | XX | .. | XX | XX | XX | XX | XX |
| | උප එකතුව | | | | | | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX | XXX(උ) | XXX | XXX | XXX |
| | මුළු එකතුව | | | | | | XXXX | XXXX | XXXX | XXXX | XXXX | XXXX(එ) | XXXX | XXXX | XXXX | XXXX | XXXX |

* මූල්‍ය ප්‍රභව12 විදේශාධාර ණය සඳහා වූ ප්‍රතිපාදන හා අමාත්‍යා'ශ යටතේ ඇති රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය ආයතන සඳහා වූ ප්‍රතිපාදන ඉවත් කරන ලද ස'ඛ්‍යා භාවිතා කල යුතුයි.

නිවැරදි බවට සහතික කරමි

ප්‍රධාන ගණකාධිකාරීගේ /අධ්‍යක්ෂ(මුදල්)ගේ අත්සන :- .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. ..

ප්‍රධාන ගණකාධිකාරීගේ අධ්‍යක්ෂ(මුදල්)ගේ නම :- .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. ..

දුරකථන අ'කය :- .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. .. ..

ආකෘතිය 02

අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂය :

## අනුමත වියදම් සැලසුම් අනුව මාසික මුදල් ප්‍රවාහ ප්‍රකාශය - 2010

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :

| | වියදම් ඇයිතමයන් (වැය විෂය සංකේත අංක සහිතව) | අනුමත වියදම සැලසුම් අනුව මුදල් අවශ්‍යතාවය | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සත්‍ය වියදම රුපියල් (000) | | | | | | | පුරෝකථිත මුදල් අවශ්‍යතාව රුපියල් (000) | | | | | | |
| | | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | එකතුව | ජූලි | අගෝ | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. | එකතුව |
| I | පුද්ගලික පඩිනඩි (1001 සහ 1003 ) | | | | | | | * | | | | | | | ** |
| II | අතිකාල දීමනා සහ නිවාඩු වැටුප් (1002) | | | | | | | * | | | | | | | ** |
| III | අනෙකුත් සියළුම පුනරාවර්තන වියදම් | | | | | | | * | | | | | | | ** |
| | **පුනරාවර්තන එකතුව (CF)** | | | | | | | * | | | | | | | ** |
| IV | ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර | | | | | | | * | | | | | | | ** |
| V | අනෙකුත් සියළුම ප්‍රාග්ධන වැය සඳහා | | | | | | | * | | | | | | | ** |
| VI | ර.නි.ණය සහ අත්තිකාරම් | | | | | | | * | | | | | | | ** |
| VII | තැන්පත් ගිණුම | | | | | | | * | | | | | | | ** |
| VIII | වෙනත් | | | | | | | * | | | | | | | ** |
| | එකතුව | | | | | | | * | | | | | | | ** |

* සඳහන් කරන ලද සංඛ්‍යා ආකෘති පත්‍ර (01) හි 10 වන තීරුවේ සඳහන් කරන ලද සංඛ්‍යා හා සමාන විය යුතුය.

** සඳහන් කරන ලද සංඛ්‍යා ආකෘති පත්‍ර (01) හි 11 වන තීරුවේ සඳහන් කරන ලද සංඛ්‍යා හා සමාන විය යුතුය.

ප්‍රධාන ගණකාධිකාරී අධ්‍යක්ෂ (මුදල්)
අමාත්‍යාංශයේ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට
දිනය :- -----------------

## වෙනත් දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම - 2010

රුපියල් (000)

| ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | මූලධන | පුනරාවර්තන | එකතුව |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

## දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම - 2010

රුපියල් (000)

| ශීර්ෂය | දිස්ත්‍රික් ලේකම් | මූලධන | පුනරාවර්තන | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | පුද්ගලික පඩිනඩි | වෙනත් පුනරාවර්තන | එකතුව | |
| 255 | කොළඹ | | | | | |
| 256 | ගම්පහ | | | | | |
| 257 | කළුතර | | | | | |
| 258 | මහනුවර | | | | | |
| 259 | මාතලේ | | | | | |
| 260 | නුවරඑළිය | | | | | |
| 261 | ගාල්ල | | | | | |
| 262 | මාතර | | | | | |
| 263 | හම්බන්තොට | | | | | |
| 264 | යාපනය | | | | | |
| 265 | මන්නාරම | | | | | |
| 266 | වව්නියාව | | | | | |
| 267 | මුලතිව් | | | | | |
| 268 | කිලිනොච්චි | | | | | |
| 269 | මඩකලපුව | | | | | |
| 270 | අම්පාර | | | | | |
| 271 | ත්‍රිකුණාමලය | | | | | |
| 272 | කුරුණෑගල | | | | | |
| 273 | පුත්තලම | | | | | |
| 274 | අනුරාධපුරය | | | | | |
| 275 | පොළොන්නරුව | | | | | |
| 276 | බදුල්ල | | | | | |
| 277 | මොණරාගල | | | | | |
| 278 | රත්නපුර | | | | | |
| 279 | කෑගල්ල | | | | | |
| | එකතුව | | | | | |